# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1809/7 - 2013 මැයි මස 07 වැනි අඟහරුවාදා - 2013.05.07

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී.6/2001.

**2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත**

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 95A වගන්තිය සමඟ කියවිය යුතු ඒ පනතේ 105 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සාදනු ලබන රීති.

ඉන්ද්‍රාණි සුගතදාස,
සභාපතිනිය,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය සඳහා
හා වෙනුවෙන් අත්සන් තබන ලදී.

2013 මැයි මස 02 වැනි දින,
කොළඹ දී ය.

රීති

1. මේ රීති 2013 අංක 1 දරන ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩල රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2011 ජුනි මස 30 වැනි දින හෝ එදිනට පෙර පනත යටතේ රක්ෂණකරුවකු ලෙස ලියාපදිංචි වී සිටින යම් තැනැත්තකු විසින් 2015 පෙබරවාරි මස 11 වැනි දින හෝ එදිනට පෙර එක් එක් රක්ෂණ ව්‍යාපාර පන්තිය සඳහා රුපියල් මිලියන පන්සියයකට නොඅඩු ප්‍රමාණයක් දක්වා ස්වකීය ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය වැඩි කරනු ලැබිය යුතු ය.

3. පනත යටතේ තැරැව්කරුවකු ලෙස ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකු විසින් 2014 දෙසැම්බර් මස 31 වැනි දින හෝ එදිනට පෙර රුපියල් ලක්ෂ විසිපහකට නොඅඩු ප්‍රමාණයක් දක්වා ස්වකීය ගෙවා නිමි කොටස් ප්‍රාග්ධනය වැඩි කරනු ලැබිය යුතු ය.

4. මේ රීතිවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස :-

"පනත" යන්නෙන් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත අදහස් වේ ;

"රක්ෂණ ව්‍යාපාර පන්තිය" යන්නට පනතේ "රක්ෂණ ව්‍යාපාර පන්ති" යන්න සඳහා පවරා දී ඇති අර්ථයම ඇත්තේ ය ;

"තැරැව්කරුවකු" යන්නට පනත යටතේ එයට පවරා දී ඇති අර්ථයම ඇත්තේ ය ;

"රක්ෂණකරුවකු" යන්නට පනත යටතේ එයට පවරා දී ඇති අර්ථයම ඇත්තේ ය ; සහ

රක්ෂණ ව්‍යාපාරය" යන්නට පනත යටතේ එයට පවරා දී ඇති අර්ථයම ඇත්තේ ය.

05 - 537